සියළුම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved ]

# පාසල් වලට සිසුන් තොරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

II පත්‍රය

නැණ ලොවට පා නඟන හපනුන්ට මඟ කියන

(11) "අදිති"

පැය 01 යි මිනිත්තු 15

විභාග අංකය ..............................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

01. පහත දැක්වෙන ඡේදය කියවන්න.

සීගිරිය මේ ප්‍රදේශයේ ඇති දර්ශනීය පර්වතයකි. '' සිංහ පර්වතය'' යන අදහසින් එය සීගිරිය නමින් හැඳින්වෙන බව අපේ ගුරුතුමිය අපට විස්තර කළා ය. ඊට මේ නම ලැබුණේ පර්වතය පාමුල තබා තිබෙන විශාල සිංහ රූපය නිසා ය. සීගිරි පර්වතය උඩට ටික දුරක් නැග යන විට උස ප්‍රාකාරයක් දක්නට ලැබේ. එය කදිමට ඔප මට්ටම් කර ඇත. මෙය ''සීගිරි කැටපත් පවුර '' නමින් හැඳින්වෙන බව අපේ ගුරුතුමිය පැවසුවා ය. එපමණක් නොව මේ කැටපත් පවුරේ ලියන ලද කුරුටු ගී අදත් දක්නට පුළුවනි.

✸ **ඡේදය ඇසුරින් පිළිතුරු සපයන්න.**

(1) ඡේදයෙන් විස්තර වන ස්ථානය කුමක්ද?.......................................................................

(2) ''සීගිරියට'' එම නම ලැබීමට හේතුව කුමක්ද? ...........................................................

.......................................................................................................................................

(3) සීගිරි කැටපත් පවුරේ ලියා ඇත්තේ මොනවාද? ............................................................

(4) දික් ඉස්පිල්ලෙන් ආරම්භ වන තනි අකුරේ වචනයක් සොයා ලියන්න.

.......................................................................................................................................

(5) ''යටට''යන පදයට විරුද්ධාර්ථය දෙන පදය ඡේදයෙන් සොයා ලියන්න.

.......................................................................................................................................

(6) මෙහි කදිමට ඔප මට්ටම් කර ඇති උස ප්‍රාකාරය කුමන නමකින් හැඳින්වේද?

.......................................................................................................................................

(ලකුණු 06)

02. පහත පදවලට ගැළපෙන ස්ත්‍රී ලිංග පදය ලියන්න.

(1) වෛද්‍යවරයා - ..........................................................................................

(2) සිංහයා - .......................................................................................... (ලකුණු 02)

03. නිවැරදි අකුර තෝරා හිස්තැන මත ලියන්න.

(1) ක .......... මැදිරියා (ණ/න)

(2) පු .......... න් (ළු/ලු) (ලකුණු 02)

04. පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළුවල තේරුමට ගැළපෙන ප්‍රස්තාව පිරුළ වරහන් තුළින් තෝරා ලියන්න.

(1) දුක් මහන්සියෙන් කළ වැඩක ප්‍රතිඵලයක් නොලැබීම.

.......................................................................................................................................

(2) කෙටි පාරක් තිබියදී දුර පාරකින් යාම.

.......................................................................................................................................

(කළුවා මාරපන් ගියා වගේ/ පරංගියා කෝට්ටේ ගියා වගේ/ ගඟට ඉනි කැපුවා වගේ)

(ලකුණු 02)

05. සුදුසු විරාම ලකුණු යොදන්න.

ඉක්මනට ගෙදර එන්න අම්මා පැවසුවා ය (ලකුණු 01)

06. දී ඇති පදවල අරුත් පැහැදිලි කරන්න.

(1) දෛනික - ..................................................................

(2) කලල් කරගන්ඩ - ..................................................................

(3) ස්වෙච්ඡාවෙන් - .................................................................. (ලකුණු 03)

07. පහත වැකි ලිඛිත භාෂාවට හරවා ලියන්න.

(1) ගොවියා උදෑසන ම කුඹුරට ගියා.

..................................................................................................................................

(2) නිළිය රංගනයේ යෙදුනා.

..................................................................................................................................

(3) ඔවුහු ගී ගයමින් විනෝද වෙනවා.

..................................................................................................................................

(4) ගංගා ගලා බසිනවා.

..................................................................................................................................

(ලකුණු 04)

08. වචන ගලපා අර්ථවත් වැකි ගොඩනගන්න.

(1) මිහිරි/ ලෙස/ ඈ/ ගීයක්/ කරයි/ ගායනා

..................................................................................................................................

(2) වේගයෙන්/ ගමන්/ මෝටර් රථය/ කරයි

..................................................................................................................................

(3) රසවත්/ කතන්දර/ සීයා/ කියයි

..................................................................................................................................

(ලකුණු 03)

09. පහත දැක්වෙන සිංහල වචනයට ගැළපෙන ඉංග්‍රීසි වචනය ඉංග්‍රීසි අකුරෙන් ලියන්න.

(1) හාවා - ............................................................

(2) ගුවන්යානය - ............................................................ (ලකුණු 02)

10. වචන ගලපා ඉංග්‍රීසි වැකි ගොඩ නගන්න.

(1) have / a / I / pen - ..........................................................................

(2) brother/ My/ is /cricket / playing - ..........................................................................

(ලකුණු 02)

11. පහත සිංහල වැකිය ඉංග්‍රීසියට හරවා ඉංග්‍රීසි අකුරින් ලියන්න.

ඔබ මොකද කරන්නේ?..........................................................................................................


(ලකුණු 01)

12. පහත දෙමළ වැකියේ අර්ථය සිංහල භාෂාවෙන් ලියන්න.

එනදු වයදු පත්තු .............................................................................................................. (ලකුණු 01)

13. පහත සිංහල වැකිය දෙමළ භාෂාවෙන් කියන ආකාරය සිංහල අක්ෂර භාවිතයෙන් ලියන්න.
අත් පොඩි ගසන්න .................................................................................... (ලකුණු 01)

14. පහත දැක්වෙන පිංතූරවල නම් දෙමළ භාෂාවෙන් කියන ආකාරය සිංහල අකුරින් ලියන්න.

| | |
|---|---|
|  |  |
| ......................................................... | ......................................................... |

(ලකුණු 02)


✸ **පහත ගණිත ගැටලු විසඳන්න.**

15. 14595 සංඛ්‍යා නාමය ලියන්න. ..................................................................................................

..................................................................................................................................................

16. $2 \times 6 =$ ...... පිළිතුර රෝම සංඛ්‍යාවෙන් ලියන්න. ..........................................................................


17. අඳුරු කර ඇති කොටස දශම සංඛ්‍යාවක් ලෙස දක්වන්න.



.........................................................

18. 2(6)795 රවුම් කළ ඉලක්කමේ වටිනාකම කොපමණද? .........................................................

19.



දී ඇති රූපයේ කාලක් $\left(\frac{1}{4}\right)$ අඳුරු කර දක්වන්න.

20. වත්තකින් ජනවාරි මස පොල් ගෙඩි 3576 ක් ද අප්‍රේල් මස පොල් ගෙඩි 2118 ක් ද කඩන ලදී. මාස දෙකේම කැඩූ මුළු පොල් ගෙඩි ගණන සොයන්න..................................................

21. බණ්ඩාරනායක විද්‍යාලයේ සිසුන් 1275 ක් ද විද්‍යාදර්ශ විද්‍යාලයේ සිසුන් 3132 ක් ද ඉගෙනුම ලබති. පාසල් දෙකේ සිසුන් අතර වෙනස සොයන්න. ..........................................

22. තාත්තාගේ බර $55kg\ 33g$ කි. පුතාගේ බර $20kg\ 96g$ කි. දෙදෙනාගේ මුළු බර සොයන්න. ..........................................................................................................................

23. බැරලයක පොල්තෙල් $25l\ 30ml$ ක් ඇත. එයින් තෙල් $12l\ 500ml$ ක් ප්‍රයෝජනයට ගත් විට බැරලයේ ඉතිරි පොල්තෙල් ප්‍රමාණය සොයන්න..................$l$............................$ml$

24. තාත්තා වෙළඳ සැලෙන් සීනි $1kg$ ක් මිල දී ගෙන වෙළෙන්දාට රු.500.00 ක් දුන් විට වෙළෙන්දා ඉතිරි මුදල ලෙස රු. 150.50 ක් තාත්තාට දෙන ලදී. එසේ නම් සීනි $1kg$ යක මිල සොයන්න. ..........................................................................................................................

25. ගොවියෙක් පළමු දිනයේදී කානුවකින් $12m\ 50cm$ ක කොටසක් ද දෙවන දිනයේ දී $10\ m\ 75\ cm$ ක කොටසක් ද කපන ලදී. දින දෙක අවසානයේදී ගොවියා කැපූ කානුවේ මුළු දිග සොයන්න. ..........................................................................................

26. $A$ නගරයේ සිට $B$ නගරයට දුර $25km\ 500m$ කි. B නගරයේ සිට C නගරයට දුර $30km\ 750m$ කි. එසේ නම් A නගරයේ සිට C නගරයට දුර සොයන්න.

..........................................................................

27. නාලක ගමනකින් $\frac{1}{4}$ ක් දුම්රියෙන් ගමන් කළ අතර ඉතිරි දුර වන $36km$ බසයෙන් ගමන් කළේය. නාලක ගමන් කළ මුළු දුර සොයන්න. ...........................................................

28. අම්මා පෙ.ව.12.45 ට ආහාර පිසීම සඳහා අවදි වූයේ නම් අම්මා අවදි වූ වේලාව සම්මත ක්‍රමයට ලියන්න. ..........................................................................................................................

29. චමිඳු පෙ.ව.11.30 ට පාඩම් කිරිම අරඹා ප.ව.2.15 තෙක් පාඩම් කළේය. චමිඳු පාඩම් කළ කාලය සොයන්න. පැය ................................ මිනිත්තු. ........................................

✸ **අංක 30 සිට 59 තෙක් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

30. සූර්ය නමස්කාරය ක්‍රියාකාරකම සිඳු කිරීමට දවසේ සුදුසුම කාලය වන්නේ,
(1) උදේ කාලයයි. (2) දහවල් කාලයයි. (3) රාත්‍රී කාලයයි.

31. සිත් පහන් කිරීමේ ක්‍රියා කාරකමේ තුන්වන පියවරට පසු පියවර වන්නේ,
(1) අධිෂ්ඨානය (2) ප්‍රාර්ථනාව (3) උදානය

32. පොඩි කිරීමෙන් පසු ආහාරයට ගන්නා පලතුරු වර්ගයකි ,
(1) ලාවුලු (2) දඹ (3) උගුරැස්ස

33. පුස්තකාලය තුළ නොකළ යුතු දෙයකි.
(1) ලබා ගත් පොත් එම ස්ථානයේම තැබීම.
(2) පොත්වලට හානි නොකිරීම.
(3) ශබ්ද නැගෙන සේ හැසිරීම.

34. කෝලම් රටා නිර්මාණය කරන්නේ ,
(1) ද්‍රවිඩ ජනතාව (2) සිංහල ජනතාව (3) මුස්ලිම් ජනතාව

35. සතුටින් සිටීමට නම් අපේ ජීවිතය ,
(1) සංකීර්ණ විය යුතුයි. (2) මුදල් තිබිය යුතුයි. (3) සරල විය යුතුයි.

36. සිහින් දිගටි පත්‍ර දක්නට ලැබේ ,
(1) පේර (2) ගස්ලබු (3) ගොයම්

37. පොදුවේ භාවිතා කරන භාණ්ඩයකි.
(1) අත් ඔරලෝසුව (2) දත් බුරුසුව (3) බිත්ති ඔරලෝසුව

38. කෙනෙකුට තවත් කෙනෙකුගෙන් බෝවන රෝගයකි ,
(1) අම්ල පිත්ත රෝගය (2) හෘද රෝග (3) වෛරස් උණ

39. පොල් සම්බෝලයක් ගලේ ඇඹරීමේදී පොල් වලට අමතරව යොදන ද්‍රව්‍යයක් නොවන්නේ ,
(1) ලුණු කැට (2) දෙහි (3) අමු කහ

40. ලී කැටයම් සඳහා ප්‍රසිද්ධ ස්ථානයකි. ,
(1) ඉසුරුමුණිය (2) ඇම්බැක්කේ දේවාලය (3) යාපහුව

41. වැඩි වශයෙන් ජලයේ යම් යම් ද්‍රව්‍යයන් පාවීම සිදු වන්නේ,
(1) කරදියේ (2) මිරිදියේ (3) කිවුල් දියේ

42. අධිවේගී මාර්ගවල පුවරු සඳහා භාවිතා කරන වර්ණය වන්නේ,
(1) කොළ (2) දම් (3) නිල්

43. දණ්ඩ චුම්භක දෙකකින් ආකර්ශනය වන නිවැරදි රූපය වන්නේ,

(1) | N | S | | S | N |

(2) | N | S | | N | S |

(3) | S | N | | N | S |

44. පස් සාම්පලයක් ජලය සහිත භාජනයකට දමා ටික වේලාවක් තබා බැලූ විට ඉහළින් ම තැන්පත් වන්නේ,
   (1) බොරළු
   (2) රොන් මඩ
   (3) දිරා ගිය ශාක හා සත්ව කොටස්

45. ගැඹුර වැඩි වන විට ජල පීඩනය වැඩි වන බව අවබෝධ කර ගත් අතීත මිනිසුන් කළ ඉතා වටිනා නිර්මාණයකි,
   (1) ජලාශයක වේල්ල (2) චෛත්‍ය (3) ඇළ මාර්ග

46. අතීත මුතුන් මිත්තන් ගුණත්වයෙන් උසස් බීජ තෝරා ගැනීම සඳහා යොදාගත් ක්‍රමයකි.
   (1) ජලයට බීජ දමා පාවෙන බීජ වගාවට යොදාගැනීම.
   (2) ජලයට බීජ දමා ජලයේ ගිලෙන බීජ වගාවට යොදා ගැනීම.
   (3) ලුණු ජලයට බීජ දමා ගිලෙන බීජ වගාවට යොදා ගැනීම.

47. සෙවණේ වැඩීමට ප්‍රිය කරන ශාකයකි,
   (1) ඇන්තූරියම් (2) දාස්පෙතියා (3) කුඩළු

48. ජාතික කොඩිය අඩකුඹු කරන අවස්ථාවකි.
   (1) නිදහස් දිනයේදී.
   (2) රාජ්‍ය නායකයෙක් මිය ගිය විට.
   (3) ත්‍රිවිධ හමුදා උත්සව වලදී.

49. ධීවර කර්මාන්තයේ දී මසුන් විශාල ප්‍රමාණයක් එකවර අල්ලා ගැනීමට යොදා ගනී.
   (1) බිලී කොක්ක (2) මා දැල (3) කරක

50. කොළකැඳ සාදා ගැනීමට නොගන්නා දෙයකි.
   (1) ගොටුකොළ (2) එළබටු කොළ (3) සාරණ

51. සම්පූර්ණ සඳ අහසේ දැකිය හැක්කේ,
   (1) අමාවක දිනයේ දී ය.
   (2) පසළොස්වක දිනයේ දී ය.
   (3) පුර අටවක දිනයේ දී ය.

52. පිළිස්සුනු විට නොකළ යුතු ම දෙයකි.
   (1) පිරිසිඳු ජලයෙන් සේදීම.
   (2) වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම.
   (3) දන්තාලේප ආලේප කිරීම.

53. කිරි බී වැඩෙන සතුන් දෙදෙනෙකි
   (1) වඳුරා, කටුස්සා (2) මයිනා, ගිරවා (3) අලියා, මුවා

54. කළු පොල් මාලුව සෑදීමට යොදා ගන්නා බීජ වර්ගයකි.
   (1) කොස් ඇට (2) කජු (3) කඩල

55. ආහාරයක් ලැබුණු විට ඒ බව අනෙක් සතුන්ට දැනුම් දෙන සතෙකි.
(1) බල්ලා (2) පූසා (3) කපුටා

56. පොල් ගසකින් තවත් පොල් ගසකට මාරු වීමට සම්බන්ධ කර ඇති ලණුව හඳුන්වන්නේ.
(1) පලංචිය (2) අතුර (3) කෙමන

57. ප්‍රමාණයෙන් කුඩා පන්දුවක් භාවිතා කරමින් කරන ක්‍රීඩාවකි.
(1) අත්පන්දු (2) රගර් (3) ක්‍රිකට්

58. භූමිතෙල් වලින් දියකළ හැක්කේ,
(1) ඩීසල් (2) ඒයම් (3) මලකඩ

59. ඉන්ධන පිරවුම්හලක ගින්නක් නිවීමට යොදා ගනී.
(1) ජලය (2) වැලි (3) ඔක්ෂිජන් වාතය

(ලකුණු $1 \times 30 = 30$)

60. **වෙසක් දිනය වෙනුවෙන් තාත්තත් මමත් ඉතා අලංකාර කූඩුවක් සැදුවෙමු. මම එය මිදුලේ ඇති ගසක එල්ලුවෙමි. අනතුරුව තාත්තත් මමත් ඒ සඳහා බල්බයක් දැමීමට නිවසේ තිබූ වයරයක් ගෙන නිවසේ සිට වෙසක් කූඩුව තිබෙන ගස වෙත ඇද්දෙමු. නමුත් එම වයරයේ දිග ඒ සඳහා ප්‍රමාණවත් නොවීය. අසළ තිබෙන කඩයට ගිය විට එය ද වසා තිබුණි. මාගේ අරමුණ කෙසේ හෝ රාත්‍රී වනවිට වෙසක් කූඩුවේ බල්බයක් දල්වා ගැනීමයි.**

මෙම අවස්ථාවට මුහුණ දුන්නේ ඔබ යැයි සිතා, ඔබ ඒ සඳහා සිදු කළ දෑ වැකි තුනකින් ලියන්න.

**(සෑම වාක්‍යකම වචන 05 කට වඩා වැඩි විය යුතුය. උක්තාඛ්‍යාත සම්බන්ධය නිවැරදි විය යුතුය)**

(1) ..............................................................................................................

..............................................................................................................

(2) ..............................................................................................................

..............................................................................................................

(3) ..............................................................................................................

..............................................................................................................

(ලකුණු 06)

✸ **ප්‍රශ්න පත්‍රයේ පිරිසිදු බව හා අත් අකුරු සඳහා අමතර ලකුණු 02 ක් ලබා දෙන්න.**